479 - 30



# සිංහල නවකතාවේ ආරම්භය සඳහා බල පෑ හේතු සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මහාචාර්ය කතංගමුවේ රාහුල හිමි

නූතන සිංහල සාහිත්‍යාංගයක් වශයෙන් සිංහල නවකතාවේ පහළ වීමට සුදුසු පරිසරය සකස් වූ අයුරු විමසා බැලීමට ප්‍රථම ඒ සඳහා මුල් වුණු 19 වන සියවසේ මෙරට ඇති වූ සිංහල භාෂාව නවීකරණය වීමේ මුල් අදියරේ ආරම්භක අවස්ථාව පිළිබඳ කරුණු විමසා බැලීම වඩා යෝග්‍ය වේ. ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්ව තිබී ආභ්‍යන්තරික කළකෝලාහලවලින් මිදී යළි සාමකාමී තත්වයකට පත් වන්නට පටන් ගත්තේ 19 වන සියවසේ මුල් භාගයේදී පමණය. මේ කාලය වන විට චිරන්තන ගද්‍ය සම්ප්‍රදාය සම්පූර්ණයෙන්ම යටපත් වී අමතක වී ගොස් තිබුණි. එය නැවත ගොඩ නැංවීම සඳහා මුල් වූයේ 18 වන සියවසේ මෙරට විසූ වැලිවිට සරණංකර සඟරජ හිමිය. සරණංකර හිමියන්ගේ පුරෝගාමීත්වය යටතේ වැදගත් ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇතිවිය. එම ප්‍රබෝධය, උන්වහන්සේගෙන් නොනැසී ආ ශිෂ්‍ය පරම්පරාවක් නිසා 19 වන සියවස තෙක්ම පැවතිණි.

මෙතෙක් කල් භාරතීය සම්ප්‍රදාය හා සම්බන්ධ වී තිබුණු සිංහලයට බටහිර සංස්කෘතියේ ආභාසය ලැබීමත් සමගම භාෂාව දියුණු වීමේ මංපෙත් පෑදීමට පටන් ගත්තේය. නව යුගයක් උදාවීමෙහි ලා ශාස්ත්‍රෝන්නතිය අවශ්‍ය අංගයක් විය. මෙම ශාස්ත්‍රීය ව්‍යාපාරය මුළු ලක්දිවම පැතිරී යාමට මහත් රුකුලක් ලැබුණේ මුද්‍රණ ශිල්පය නිසා යැයි කිව හැකිය. එපමණක් නොව ලක්දිවෙහි තැන තැන ප්‍රාචීන විද්‍යා පීඨ පිහිටුවීම ද එහි වැදගත් අංගයක් විය. එනම් රත්මලානේ පරම ධම්ම චෛතිය පිරිවෙණ, මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණ සහ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ පිහිටුවීම නිසා ධර්ම ශාස්ත්‍ර ඥානය පැතිරවීම ඉක්මන් විය. එසේම සංඝරාජ මාහිමියන්ගේ ශිෂ්‍යයන් වශයෙන් වලානේ සිද්ධාර්ථ හිමි, හික්කඩුවේ සුමංගල හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි එකල ශ්‍රේෂ්ඨ පඬිවරයෝ වූහ. එසේම එවකට වැජඹුණු ගිහි පඬිවරුන් අතර භාෂා ශාස්ත්‍ර යථා තත්වයෙහි පිහිටු වීමෙහි උත්කෘෂ්ට සේවයක් කළේ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා ය.

මෙසේ ශාස්ත්‍රීය පුනර්ජීවනය රට පුරා පැතිරී යාමත් සමගම මහජනයාගේ කියැවීම සඳහා පළකළ පුවත්පත් හා සඟරාද බොහොමයක් බිහිවන්නට විය. මෙසේ මුල් අවදියේ බිහි වූ පුවත්පත් හා සඟරාවන්ගෙන් නූතන සිංහල සාහිත්‍යයෙහි වර්ධනයට සිදු වූ සේවය ඉමහත් යැයි කිව හැකිය. රට පුරා ශාස්ත්‍රාලෝකයත් සාහිත්‍ය උද්යෝගයත් පැතිර වීමෙහි හේතු වූ ශාස්ත්‍රීය වාද විවාද හැම එකක්ම



පාහේ සිදු වන්නට වූයේ කිසියම් සඟරාවක් හෝ පුවත්පතක් මගිනි.

ඒ අනුව 19 වන සියවසේ පළ වූ මුල්ම සඟරාව වූයේ ''මාසික තැග්ග''යි. එය 1832 දී කෝට්ටේ නගරයෙන් බිහි වුණි. එය වැඩි කලක් පවත්වාගෙන යාමට නොහැකි වූ අතර එමගින් සිදු කෙරුණේ බයිබලයෙන් තෝරාගත් කතාන්දර පළ කොට ඒවා ක්‍රිස්තියානි මිෂනාරී පාසල් සිසුන් අතර බෙදා හැරීමයි. ඉන්පසු 1839 දී පමණ ආර්. ස්පැන්සර් හාඩි නම් වූ පියතුමාගේ සංස්කාරකත්වයෙන් ''ලංකා නිධානය'' නම් වූ සඟරාව පළ විය. මෙහිදී වැඩියෙන් ආගමික කරුණු ඇතුළත් වූ අතර එය වැඩි කලක් එක දිගට පළ නොවීය. ඉන්පසු ''උරගල'' නමින් 1842 දී හැරිස් පියතුමා විසින් සඟරාවක් පළ කළේය. එම සඟරාවද වැඩි කලක් නොපැවතිණි.

මෙසේ 1832 පමණ සිට නොයෙකුත් සඟරා පළ වුවද ඒවා ශාස්ත්‍රීය ගණයට අයත් ඒවා නොවීය. වර්ෂ 1853 දී ජෝන් පෙරේරා විසින් අරඹන ලද ''ශාස්ත්‍රාලංකාරය'' නම් වූ මාසික සඟරාව ශාස්ත්‍රීය වැදගත්කමින් යුත් මුල්ම සඟරාවයි.. මෙම සඟරාව ශාස්ත්‍රීය සඟරාවක් වශයෙන් රට පුරා පැතිරී යන්නට වූයේ එහි ''සව්සත්දම් වාදය'' ඇරඹුණායින් පසුවය. එම ලිපිය කොග්ගල ධම්මතිලක හිමියන් විසින් පළ කළ අතර එයට විරුද්ධව 1854 බටුවන්තුඩාවේ පඬිතුමා විසින් ''යතලබ'' සඟරාව පටන් ගන්නා ලදී.

479 - 22



මෙම වකවානුව වන විට සිංහල පුවත්පත් පළ වන්නට වූයෙන් සඟරාවන්හි පළ වීම අඩුවිය. මෙකල ශාස්ත්‍රීය සඟරා බිහිවීම හේතු කොට ගෙන පුවත්පත් ද ශාස්ත්‍රීය වශයෙන් වැදගත් ලෙස පළ වන්නට විය. එයින් ''ලංකා නිධානය'' වැනි සඟරාවන්හි ප්‍රචාරය අඩුවුණු නමුත් පළ වන්නට විය. ඉතා වැදගත් කරුණ වන්නේ භාෂා ශාස්ත්‍ර, ආගම්, ජ්‍යොතිෂය, ව්‍යාපාර හා දේශපාලන ආදී නොයෙකුත් විෂයයන් සඳහා කැප වුණු සඟරා බොහොමයක් සිංහලෙන් පළ වන්නට වූ නිසා සිංහල භාෂාව ඕනෑම විෂයක් සඳහා යොදාගත හැකි සුබනම්‍ය භාෂාවක් බවට පත් වීමයි.

මෙසේ මුල් අවධියේ පළ වූ සඟරා බොහොමයකින් ක්‍රිස්තියානි ආගම පිළිබඳව හා එය ප්‍රචාරය කිරීමට උත්සාහ ගත් අතර පසුව බුදු සමය හා බෞද්ධ සාහිත්‍ය පිළිබඳව සඟරා පළ වන්නට විය. 1862 ඇරඹුණු ''ක්‍රිස්තියානි ප්‍රඥප්තිය'', ''සද්ධර්ම ප්‍රකරණය'', ''බෞද්ධ වාක්‍ය ඛණ්ඩනය'' කිතුසමය පැතිරවීමේ අදහසින් මුලින්ම ඇති වූ සඟරාවන් වේ.

1863 දී මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් විසින් ඇරඹූ ''සම්‍යක් දර්ශනය'' පළමුවන බෞද්ධ සඟරාව විය. ඉන්පසු 1873 දී වැදගත් ශාස්ත්‍රීය සඟරා තුනක් පළ වී ඇත. ''සමය සංග්‍රහව'', ''සිංහල ව්‍යාකරණ'', ''සත්‍ය සමුච්චය'' සඟරායි. 1895 ''සිතුමිණ'' මාසික සඟරාව ද වැදගත් ශාස්ත්‍රීය සඟරාවක් විය.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වී විද්‍යාලංකාර හා විද්‍යෝදය පිරිවෙන් ඇති වූ පසු සිංහලෙන් පළ වන සඟරා



වැඩිවන්නට වූ අතර හොඳින් පළ වන ශාස්ත්‍රීය සඟරාවලින් සාහිත්‍යයේ ප්‍රබෝධයට හා දියුණුවට දිය හැකි රුකුල ඉමහත් විය. මෙම සඟරාවන්හි විචාර ලිපි, කෙටිකථා, නවකථා, කවි පංති, කෙටි නාට්‍ය ආදිය පහළ වීම නිසා පොදු ජනයාගේ සැලකිල්ල ඒ කෙරෙහි වැඩි දියුණු වූවා පමණක් නොව භාෂාවද සුබනම්‍ය වූවා සේ පෙනේ.

මෙසේ සඟරා පුවත්පතට ප්‍රථමයෙන් බිහි වූ අතර පළමු පුවත්පත බිහි වූයේ 1860 දශකයේ ගාල්ලේදීය. එය ''ලංකාලෝකය'' විය.ඉන්පසු 1862 ''ලක්මිණි පහන'' පත්‍රය පළවිය. මෙයට විරුද්ධව ක්‍රිස්තියානිය පැතිර වීමේ අදහසින් 1863 දී ''ලක්රිවි කිරණ'' නමින් පුවත්පතක් ප්‍රසිද්ධ කරන ලදී. මෙම පුවත්පත් දෙකම පද්‍යයෙන් ආරම්භ වූ අතර ජනතාව අතර ඉතා ඉක්මනින්ම ජනප්‍රියත්වයට පත්වන්නටද ඇත.

මේ හැර ලංකාවේ පළමුවන කවට පුවත්පත 1872 දී '' කවට කතිකයා'' නමින් පළ විය. මෙය කවට පත්‍රයක්ම යැයි කිව නොහැක්කේ බෞද්ධයන් හට අන්‍යාගමිකයන් පත්‍ර හා සඟරාවලින් පහර දෙන විට මෙමගින් ඒවා ඉතා තදින්ම වැළැක්වූ හෙයිනි. ඉන්පසු කවට පත්‍ර බොහෝමයක් බිහිවිය. ''කවට සංග්‍රහය'', ''කවට දක්ෂයා'', ''දැනුමැති කවටයා'', ''කවට අංජනම'' ආදියයි. ඉන්පසු ඉතා කෙටි කලකින් ජනප්‍රියත්වයට පත් වූ පුවත්පත වූයේ 1880 දී බිහි වූ ''සරසවි සඳරැසයි''. මෙහි සමාරම්භයේ සිටම සිංහල සාහිත්‍යයට ලැබුණු පිටුබලය මහත්ය. ''අරාබි නිසොල්ලාසයේ'' සිංහල

අනුවාදය පිළිබඳවත් "බුදුගුණ අලංකාර සංස්කරණය" පිළිබඳවත් කතුවැකි ලියමින් මෙම පුවත්පත ප්‍රසිද්ධ විය.

මෙසේ ඇරඹුණු පුවත්පත් හා සඟරා ගත්විට ක්‍රි.ව. 1885 ත් 1895 ත් අතර දශකය තුළ සිංහල සාහිත්‍ය ලෝකයේ කැපී පෙනෙන වකවානුවක් ලෙස හැඳින්විය හැකිය. මෙයට කරණා විමසා බලන විට පුවත්පත් හා සඟරා රාශියක් බිහිවීමත් ආගමික හා ආගමික නිකායයන් අතර ඔවුනොවුන් විසින් අරඹනු ලැබූ පුවත්පත් මගින් ආගමික වාද විවාදාදිය ඇති වීමත් පෙන්වා දිය හැක.එසේම පැරණි චිරන්තන සිංහල සාහිත්‍යයේ බණ කතාවලට සීමා වී තිබුණු සිංහල භාෂාව පාඨකයාගේ සාහිත්‍යය රුචිකත්වය ප්‍රබන්ධ කතා කෙරෙහි යොමු වීමත් සිදු වුණි.

මෙකල රජයේත් සමාජයේත් උසස් තැන්වල ක්‍රිස්තියානි ලබ්ධියට මුල්තැන ලැබුණු අතර ඒ නිසා ඉහළ මධ්‍යම පංතික පවුල්ද ක්‍රිස්තියානියට හැරිණි. "ලක්මිණි පහන" හා "සරසවි සඳරුස" මගින් මෙම යුගයේ බෞද්ධයන් ක්‍රිස්තියානිය වැළඳ ගැනීම වැලැක්වීමත් ඔවුන් අතර බුද්ධාගම හා බෞද්ධ උත්සවත් බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ උනන්දුවක් ඇති කරලීමට දැඩි ප්‍රයත්නයක් දරනු ලැබීය. වෙසක් ආදී උත්සව පිළිබඳ බෞද්ධයන් උනන්දු කරවීමද මෙම පුවත්පත්වල ප්‍රධාන පරමාර්ථය විය. එසේම "මහා සුපින" වැනි ජාතක කථා ද ආනන්ද ස්ථවිර, කාශ්‍යප ස්ථවිර ආදී චරිත කථා දැක්වීමද මෙවැනි පුවත්පත් මගින් සිදුවිය.



භාෂා පුනරුත්ථාපනයේ මීළඟ අදියර වී ඇත්තේ විදේශීය කෘති පරිවර්තනය සඳහා සුදුසු බසක් ඇති වී තිබීමයි. 1886 දී රාමායණය හෙවත් රාවණ සංහාරයද "Gulliver's Travels" නමැති Jonathan Swift ගේ ඉංග්‍රීසි කෘතියේ පළමු වැනි කොටස 'Voyage to Lillrput' ඒ. ජේ. ඩබ්. මාරඩේ විසින් 'ගලිවර් නම් අය ඉතා කුඩා මනුෂ්‍යයන් රටට පැමිණීමේ ආශ්වර්යමත් කථා ප්‍රවෘත්තිය' යි. සිංහලයට නගා ප්‍රසිද්ධ කර ඇත. ඒ 1888 දීය. 1890 දී පෘතුගීසි බසින් ලියවුණු "හිත් දෙක" ඩබ්. ඇම්. ප්‍රනාන්දු විසින් පළ කොට ඇත.

මෙසේ 1864 ත් 1876 ත් අතර පුවත්පත්වල පළ වූ කෙටි ගද්‍ය ආඛ්‍යාන භාෂාව ගත්විට එකල පුවත්පත් හා සඟරා සඳහා යොදාගත් සිංහල භාෂාව කෙසේද යන්න සොයා ගත හැකිය.

> "තමන්ගේ ඉසුරු පිණිස බොරුවක් සැබෑ
> ලෙස අඟවාගෙන ලොව රවටා බොරු
> කියමින් වස්තු උපයන එක්තරා ආඪියෙක්
> සිටියාය"

ලක්මිණි පහන - 9- 11- 1864

මහනුවර යුගයේ පටන් බයිබල පරිවර්තන මගින් දිගටම පැවත ගෙන ආ කටවහරෙ වචන හා ක්‍රියා රූප පදනම් කොටගත් මෙම ලිහිල් ඇතැම් විට අව්‍යක්ත සම්ප්‍රදාය හා වියරණ විරෝධී ශෛලිය එකල පුවත්පත්වල පමණක් නොව

ක්‍රිස්තියානි ආගමික ආඛ්‍යාන වලද යෙදුණු බව පහත සඳහන් පාඨ වලින් පැහැදිලි වේ.

> ''ඔහුගේ භාර්යාව අහිංසක ස්ත්‍රියක්ය. ගෙදර කොපමණ හිඟ පාඩු තිබුනේ වී නමුත් පුරුෂයාට හිංසා කලේ නැතුවත් ඇය ඔහුගේ වැඩපල කර්මාන්තාදියට ඉතා උපකාරියක්ව සිටියාය''.
>
> ග්‍රාම ප්‍රවෘත්තියක් - 1876

1876 සිංහලයේ ප්‍රධාන ගද්‍ය ශෛලිය ලෙස පැවතියේ මෙම සිංහල කට වහරට ලං වූ රීතියයි. එහෙත් 1876 ත් 1878 ත් අතර පළ කරනු ලැබූ ග්‍රන්ථ කීපයක් පැරණි චිරන්තන සාහිත්‍ය කෘතිවල රීතියට හුරු ශෛලියක් සකස් කරන්නට ඒවායේ කතුවරුන් උත්සාහ දරන ලදී.

කුඩා ක්‍රිස්තියානි සඟරා අතර C.W. de Silva දේවගැතිතුමාගේ ''පවුලේ මිත්‍රයා'' 1866 J.W. de Silva ගේ ''රුවන් මල්දම ද'' Symande silva නම් දේවගැතිතුමාගේ කෙටි කතා ඇතළත් ''සිතුය'' නම් මාසික සඟරාවද මෙහිලා නවකතාවෙහි ප්‍රභවය සඳහා ඉටුකළ කාර්යභාරය ඉතා වැදගත්ය.

මෙසේ ශතවර්ෂ ගණනක් මුළුල්ලේ ව්‍යවහාර නොකිරීම නිසා අපභ්‍රෂ්ට වී ගිය සිංහල ගද්‍යය වර්තමාන අවධියේ පළමුවරට නැවත ව්‍යවහාරයට පාත්‍ර වූයේ පුවත්පත් හා සඟරා මගින්ය. තදනුගත පුවත්පත් නිසා ගද්‍ය විලාසය

477 -34



බොහෝ දියුණු විය. එපමණක් නොවේ බොහෝ පුවත්පත් මගින් නිතරම පාහේ පෙරදිග කතා හා යුරෝපීය කථාද පළ වූ හෙයින් පාඨකයා තුළ නවකතා කියවීමේ ආසාව දියුණු කිරීම සම්බන්ධයෙන්ද නවකතාකරණයට උවමනා වන සරල මට සිළුටු වාග් විලාසයක් සකස් කිරීම සම්බන්ධයෙන්ද, පුවත්පත් මගින් අප්‍රමාණ සේවයක් සිද්ධ විය.

මේ අනුව මුල්ම සිංහල නව කතාව මුල්ම සිංහල පුවත්පත් නිසා හටගත් අතුරු ඵලයක් ලෙස හැඳින්විය හැකිය. ප්‍රකට හා පැරණිතම නිදසුන නම් 1866 - 1883 දක්වා පළ වූ 'රුවන් මල්දම' නම් සඟරාවෙහි ''වාසනාවන්ත පවුල හා කාලකණ්ණි පවුල'' නම් ප්‍රබන්ධ කතාව පළ වීමයි.එසේම ''සීංහල'' සඟරාවෙහි 1895 දී ඇලෙක්සැන්ඩර් ඩූමාගේ ''කවුන්ට් ඔෆ් මොන්ට් ක්‍රිස්ටෝ ''නම් නවකතාව කොටස් වශයන් පළවිය.මෙසේ මුල් යුගයේ සිංහල නවකතා කොටස් වශයෙන් සිය පාඨකයන්ට කියවීමට සැලැස්වීම පෙරදිග මෙන්ම අපරදිග කතාද කියවා ආශ්වාදයක් ලැබිය හැකි අයුරින් ඉදිරිපත් කිරීම ආදී කටයුතු ප්‍රමාණයක් 1850 - 1915 දක්වා සිංහල පුවත්පත් කතුවරු අතින් සිද්ධ වූ බැවින් සිංහල නවකතාව බිහි වීමට පසුබිම සකස් කළ පියා ලෙස පුවත්පත් හා සඟරා නම් කළ හැකිය.

මීට අමතරව මෙම යුගයේ පැවති වාද විවාද මගින්ද මේ සඳහා උචිත පසුබිම සකස් වූවා යයි කිව හැකිය. මේවායින් භාෂාව, ශාස්ත්‍රය, ආගම ආදී අංශ තුළ පැවති සැක කටයුතු තැන් හෙළි කිරීම සිද්ධ විය.මේ සඳහා යොදාගත්

භාෂාව ව්‍යාකරණයෙන් හා රීතියෙන් පැරණි භාෂාවට වඩා වෙනස් බවද පෙනේ. කථා ව්‍යවහාරයෙහි හැඩ ගැසුණු මේ බස පළමු වරට සාහිත්‍යය සඳහා යොදා ගත්තේ මෙම වාද විවාද සමයේය. සව්සත්දම් වාදයෙන් ඇති වූ මෙම ප්‍රතිඵලය නිසා 20 වන සියවසේ නවකතාව සඳහා භාෂාව සකස් වූවා යයි කිව හැකිය. ඒ නිසා සිංහල සාහිත්‍යයට මහත් පිටුවහලක් මෙම 1854 දී ඇති වූ 'සම් සත්දම් වාදය' නිසා ඇති වූයේ යයි කිව හැකිය.

1873 දී ඇරඹි සත්‍යසමුච්චය සඟරාව තුළින් ''සිදත් සඟරා වාදය'' හා 1891 'ජානකීහරණ වාදය' ආරම්භ කෙරිණ. ඇතැම් වාද වලින් පොත් පිළිබඳ විවේචනයට භාජනය කොට ඇත.1894 හටගත් 'නක්ෂත්‍ර වාදයද' එවැන්නකි.

සිංහල නවකතාව බිහි වීමට පෙර සිදු වූ තවත් වාදයක් නම් ''ණ කාර න කාර'' වාදයයි. ''සරසවි සඳරැස'' නම් පත්‍රයෙහි ණ න යෙදීම පිළිබඳව කරන ලද විග්‍රහයක් නිසා මෙම වාදය හටගත් බව පෙනේ.

පියදාස සිරිසේනයන්ගේ ''ජයතිස්ස හා රොසලින්'' කතාව සඳහා වස්තු වී ඇති කරුණු විමසන විට ක්‍රිස්තියානි- බෞද්ධ දෙපක්ෂයේ වාද විවාද කෙතරම් දුරට සිංහල නවකතාවේ ප්‍රභවයට හේතු වී ඇතිද යන්න ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. එසේම සයිමන්ද සිල්වාගේ ''තෙරිසා'' නම් නවකතාවද ආගමික අංශය නිරූපණය කෙරිණ.



ඒ අනුව 19 වන සියවසේ හටගත් ආගමික වාද විවාද සිංහල නවකතාවේ ප්‍රභවය හා එහි පසුබිම සකස් වීම සම්බන්ධයෙන් කොතරම් බලපෑමක් කර ඇතිද යන්න ඉහත නිදසුන් වලින් පැහැදිලි වේ. එසේම එම සියලු වාද විවාද පුවත්පත් මගින් කර ඇති නිසා භාෂාවේ සකස් වීමට මග පෑදුණා සේම පාඨක සංඛ්‍යාව විශාල වීම සඳහාද උපකාරී වී ඇත.

මෙසේ ජාතික, ආගමික, භාෂා ව්‍යාපාරයන්ගෙන් ලත් පෝෂණය සිංහල නවකථාවේ බිහිවීමේ පසුබිම සඳහා උපකාරී වූවා සේම සාහිත්‍යමය අංශ පිළිබඳව අවධානය යොමු කරන විට ඒ සඳහා නාට්‍ය, කාව්‍ය හා පරිවර්තන මගින්ද විශාල දිරි දීමක් සිදු වී ඇති බව පෙනේ.

නාට්‍ය අංශය ගත්විට අංග සම්පූර්ණ නාට්‍යයන්ගේ ස්වරූපය දරන පළමුවෙනි සිංහල කෘති නාඩගම් යැයි සැලකේ. මෙම අභිනව සාහිත්‍යය හැඩ ගැසීමෙහිලා නාඩගම් වලින් සිදු වූ සේවය දෙවැදෑරුම්ය. නාඩගම් වලින් ගැමි සාහිත්‍යයට හා ගැමි වහරට රුකුලක් ලැබුණාසේම මුද්‍රිත නාඩගම් නිසා ගිහි ජීවිතය පිළිබඳ කථා ප්‍රවෘත්ති කියවීමේ අභිරුචිය මහජනයා තුළ වර්ධනය වීම දැකිය හැකිය. මේ කාරණා දෙකෙන්ම නවකතා උත්පත්තිය සඳහා සාහිත්‍ය ක්ෂේත්‍රය සකස් විය.

පළමු නාඩගම්කරුවා පිලිප්පු සිඤ්ඤෝය.මොහු විසින් ප්‍රබන්ධ කරන ලද කෘති අතර ඇහැලේපොල නාඩගම,

මාතලන්, සෙන්ගප්පු, සිංහවල්ලි, විශ්ව කර්ම, සන්නිතුලා, රජතුන් කට්ටුව ආදී නාඩගම් පොත් හඳුන්වා දිය හැක. මේ අනුව පිලිප්පු සිඤ්ඤෝ නොයෙකුත් දේශවලින් තම ප්‍රබන්ධ සඳහා වස්තු සපයාගත් බව පෙනේ. සිංහල ඉතිහාසය, දෙමළ සාහිත්‍යය, ජනකතා, ක්‍රිස්තියානි පුවත් ආදිය ඔහුගේ සැලකිල්ලට ලක් වී ඇත. සිංහල නවකතාවේ ප්‍රභවය සම්බන්ධයෙන්ද මේ කරුණු වැදගත්ය.

මෙසේ නාඩගමෙන් පසුව ජනප්‍රියත්වයට පත් වූයේ නූර්තිය. නූර්ති සාහිත්‍යයේ ආදි කතුවරයා සී. දොන්. බස්තියන් ජයවීර බණ්ඩාර මහතාය. එසේම ජෝන්ද සිල්වා ද මෙම නාමාවලියට අයත් වේ. සී. දොන්. බස්තියන් විසින් ''රාමායණය'' 1886 දී සිංහලයට පරිවර්තනය කරන ලදී. මෙය සිංහල පාඨකයන් විසින් මහත් රුචියෙන් කිය  වූ ප්‍රබන්ධ කතාවකි.

එසේම ජෝන්ද සිල්වාගේ ''පරාභව නාටකයද'' සිංහල පත්‍රවල කොටස් වශයෙන් පළ විය. ඒ අනුව මුල් යුගයේ සිංහල පුවත්පත්වලින් මෙන්ම සිංහල නාටකයෙන්ද නවකතාවේ ආරම්භයට කොතරම් විශාල සහයක් ලැබිණිද යන්න මෙයින් පෙනේ.

මීට අමතරව සිංහල නවකතාව බිහිවීමට අවශ්‍ය වූ මග සකස් වීමට බල පෑ තවත් සාහිත්‍යාංගයක් වූයේ කවි

479 -36



කතාය. එයින් සම්ප්‍රදායික වර්ණනාවලට වඩා කථාන්දරයට මුල් තැනක් ලැබුණි. ඒ නිසා 19 වන සියවසේ මේ සම්බන්ධයෙන් ද විශාල උනන්දුවක් ඇති වන්නට විය. මෙහි අවසානයට 'කතාව' යන කොටස එකතු වේ. ගජබා කතාව, මලේ රාජ කතාව ලෙසනි. මෙයින් කියවන ජනයාට අවවාද අනුශාසනා කරයි. එසේම 'මාලය' යන කොටස අවසනට එක් කිරීමෙන් සාදා ගන්නා රත්නමාලය, අනුරාගමාලය ආදී කාව්‍යයද මේ යුගයේ දී විශාල වශයෙන් ව්‍යාප්ත විය. එසේම 'සැහැලි' නම් වූ පද්‍ය විශේෂයක්ද තිබිණි. සද්දන්ත හෑල්ල ආදියයි. මෙසේ සඳහන් කළ සැහැලි හා මාල කාව්‍ය විශාල වශයෙන් මුද්‍රණය කරවා මහජනයා අතර බෙදා හැරීමෙන් කියවීමේ රුචිය වර්ධනය විය.

එසේම 19 වන සියවසේ ප්‍රබන්ධ කතා කියවීමට පවා මහජනයා පුරුදු කළ තවත් කුඩා කාව්‍ය  කොටසක් වූයේ හටන් කාව්‍යයයි. කුත්තන්තීනු හටන ආදියයි. 1883 දී පළ කරන ලද පද්‍ය 74 කින් යුත් ''අරාබි හටන'' හොඳ හටන් කාව්‍යයක් ලෙස නම් කළ හැකිය. මෙසේ පුවත්පත් සඟරා පහළවීමත් සමඟම කවි ලියන්නන්ගේ සංඛ්‍යාවද මෙම යුගයේ සීඝ්‍රයෙන් වර්ධනය විය.

එ බඳු රචනාවන්ගෙන් බලාපොරොත්තු වනලද්දේ විනෝදය ලැබීම විනා උපදේශයක් ලැබීම නොවේ. එහෙයින් මෙබඳු පොත් 19 වන සියවසේ දී සුලභ වීම සිංහල

නවකතාවේ පහළ වීමට හේතුවක් වන්නට ඇත. පරිවර්තන සාහිත්‍ය ගත් විට එය වර්ධනය වූයේ ස්වතන්ත්‍ර නිර්මාණ විරළ වූ සමයේය. මේ පරිවර්තන සාහිත්‍ය නිසා සිංහල පාඨකයන් අතර නවකතා කියවීමේ රුචිය තියුණු විය. මෙකල සිදු වූ පළමුවෙනි පරිවර්තනය වූයේ කුටුම්බ සංරක්ෂණී නම් පොතය. 1867 දීය. එහෙත් සිංහල නවකතාවේ ප්‍රභවයට හා වර්ධනය කෙරෙහි වෙනත් සෑම කෘතියකටම වඩා බලපෑවේ ''රාමායණයයි'' පරිවර්තන අතර මෙය දෙවෙනි වන්නේ ''අරාබි නිසොල්ලාසයට පමණි. රාමායණය මුල් යුගයේ සිංහල නවකතා කීපයක් කෙරෙහි විශාල වශයෙන් බලපෑ කෘතියකි ඇල්බට් ද සිල්වාගේ ''විමලා'' (1892) හා ''සිරිබරි'' (1894) ග්‍රන්ථ සඳහා ද පියදාස සිරිසේනගේ ''ජයතිස්ස හා රොසලින්'' ප්‍රබන්ධය කෙරෙහි ද රාමායණයේ ආභාසය ලැබී ඇත. ''අරාබි නිසොල්ලාසය'' ගත් විට එහි බලපෑම ඇල්බට් ද සිල්වාගේ කෘති හතරේම ප්‍රබලව ම දැකිය හැකිය. ගුප්ත අභව්‍ය ලෝකයක් මවාපෑම තත් කෘති තුළින් දැකිය හැකිය.

මුල් යුගයේ සිංහල ප්‍රබන්ධ කතා කරුවන් සියලුදෙනාම පාහේ තම කෘතිවල වනාන්තර හා ගල්ගුහා ගැන සඳහන් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළයුත්තක් තරම් සිතූ ලෙස පෙනේ. මෙයට සයිමන් ද සිල්වාගේ ''මීනා'' කෘතියත් අයිතිය. එසේම මුල් යුගයේ නවකතාවේ අද්භූත බව පෙන්වීමට වෙස්වළා ගැනීමට සැලැස්වීම ආදී ලක්ෂණ දැකිය හැකිය. ''ජයතිස්ස හා රොසලින්'' කතාවේ රොසලින් වෙස්



ගැන් වී සිටීම. එසේම බොහෝ නවකතා සඳහා තාපසයෙකු පිවිසීම ද දැකිය හැක. පියදාස සිරිසේනගේ ''අපට වෙච්ච දේ'' නවකතාවේ වීරසේකර චරිතය එවැන්නකි.

මෙසේ 19 වන සියවසයේ සිංහලයට එකතු වූ නවාංගයක් පිළිබඳව විමසා බලන විට එයින් මෙතෙක් පැවති ලේඛන සාහිත්‍යයේ විශාල විපර්යාසයන් රාශියක් ඇති කිරීමට හේතු වූ බව පෙනේ. ක්‍රිස්තියානීන් හා සිංහලයන් අතර තරගකාරී ස්වරූපයේ සඟරා හා පුවත්පත් පමණක් නොව ආගම අරබයා සිදු වූ වාද විවාදයන් ද එවකට වූ බව පෙනේ. මේ සියල්ලම තුළින් සිදුවූ වැදගත් කර්තව්‍ය වූයේ භාෂාව නවීකරණය වීම හා පාඨක පිරිස දැනුවත් වීමයි. සාක්ෂරතාව හා කියවීමේ හැකියාව දියුණු කරගත් පාඨකයන්ට වැඩි වශයෙන් නොයෙක් කරුණු අරබයා පුවත්පත් හා සඟරා 19 වන සියවස අග වන විට බිහි වූ බව පෙනේ.

ආගමික වශයෙන් සිදු වූ වාද විවාද සාහිත්‍යයද ශාස්ත්‍රීය අංශයට උර දෙමින් පුවත්පත් හා සඟරාවන්හි පළ වූ බවද පෙනේ. ජාතික වශයෙන් මුද්‍රණාල වලින් සිදු වූ සේවාව මෙතෙකැයි කිව නොහැකි තරම්ය. මෙයින් සිදු වූ එක් මෙහෙයක් වූයේ සිංහල බෞද්ධයන් කාලයක් තිස්සේ ඇති කරගෙන තිබුණු අන්ධ භක්තිය අඩු වී විරුද්ධ මතවාදීන්ගේ අදහස්වලට සවන් දීමට ආභාසයක් ලැබීමයි.

සාහිත්‍යයම වශයෙන් සිදු වූ ප්‍රවණතාව සොයා බැලීමේ දී එය අංශ කිහිපයකට යොමු වූවා සේ පෙනේ. එනම් නාට්‍ය, කවි හා පරිවර්තන සාහිත්‍ය ලෙසයි. මේ අනුව නාඩගම් ඇති වීමත් නූර්ති ඇති වීමත් තුළින් නවකතාකරණය සඳහා සුදුසු පොදු බසක් සාහිත්‍යයට පිවිසුණා යයි කිව හැකිය. ව්‍යවහාර බසින් තම රචනා විලාසය පෝෂණය කිරීමට නවකතාකරුවෝ තැත් කළහ. පොදු ජීවිතයේ ගැටලු සංකීර්ණ අවස්ථා විස්තර කිරීම පරමාර්ථය නුවූ හෙයින් තම කාර්ය සඳහා සාහිත්‍යයික භාෂාව සෑහෙන තරම් ව්‍යක්ත නොවූ බව නවකතාකරුවන්ට පෙණිනි.එහෙයින් ප්‍රතිභා සම්පන්න කතුවරු එදිනෙදා ව්‍යවහාර භාෂාව උපයෝගී කොට ගත්හ.කවි කොළය සාහිත්‍යාංගය තුළින්ද සිදු වූයේ එවැන්නකි. ලොවේ සිදුවන පුවත් ගැමි ජනතාවට දැනගත හැකි මාර්ගය බවට පත් වූයේ මෙයයි. එසේම සිදුවීම සම්පූර්ණ වශයෙන් අඩංගු කිරීම නිසා විස්තර ප්‍රචාරය වීම මනාව සිදුවිය.

පරිවර්තන සාහිත්‍යයද මනා පිටිවහලක් සැපයීය. එමගින් නවකතාකරණයට සුදුසු පසුබිම සම්පූර්ණයෙන්ම හැඩ ගැසුනේ යැයි කිව හැකිය. එම කෘති අනුකරණයෙන් මුල් ප්‍රබන්ධ කතා ලැබූ ආභාසය මෙතෙකැයි කිව හැකි නොවේ.

479 - 38



මෙම කරුණු අනුසාරයෙන් බලන කල සිංහල නවකතාව ප්‍රභවය ලැබීම සඳහා සුදුසු පසුබිම 19 වන සියවස තුළ ඇතිවූ සියලු ශාස්ත්‍රීය අංශයන්ගෙන් ඇතිවූ වා යැයි කිව හැකිය. එයට එක් අංශයක පමණක් දායකත්වයක් සිදු වූ වා යැයි කිව නොහැකිය. 19 වන සියවසයේ ලොව පුරා ඇතිවූ මුද්‍රණ ශිල්පයේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේද ශාස්ත්‍රාලෝකය පැතිරී යාම සිදු විය. එයින් ඇති වූ සාක්ෂරතාව ලේඛන මාධ්‍ය සඳහා යොදා ගැනීම නිසා ඇති වූ නව වස්තු විෂයක් පෝෂණය වීම සඳහා ජාතික, ආගමික,භාෂා හා සාහිත්‍ය ව්‍යාපාර මගින් සිංහල නවකතාව නම් වූ සාහිත්‍යාංගය ඇති වීමට සුදුසු පසුබිම සකස් වූයේ විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. කුමාරසිංහ කුලතිලක — අද්‍යතන සිංහල නවකථා ප්‍රථම භාගය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
2. තිලකරත්න. මිණිවන් පී — සියවසක පෙරළිය හා සිංහල නවකතාවේ පදනම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1989.
3. පඤ්ඤාසේකර හිමි කලුකොඳයාවේ — සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1967.
4. මැද්දේගම උදය ශාන්ත — සියවසක සිංහල නවකථා, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ, 2003.
5. රාජකරුණා. ආරිය — සාහිත්‍ය රුචිය හා නවකතා විචාරය,

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1989.

6. වික්‍රමසිංහ. කේ. ඩී. පී. නූතන සිංහල සාහිත්‍යය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965.

7. වික්‍රමසූරිය සරත්චන්ද්‍ර සිංහල නවකථාවට මග පෑදීම, සරසවි මුද්‍රණාලය, මහනුවර, 1970.

8. වික්‍රමසූරිය සරත්චන්ද්‍ර සිංහල නවකථාවේ නැගීම, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ, 1972.

9. වික්‍රමසූරිය සරත්චන්ද්‍ර නවකථා විවරණය, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, 1963.

10. සරච්චන්ද්‍ර එදිරිවීර සිංහල නවකථා ඉතිහාසය හා විචාරය, සමන් මුද්‍රණාලය, මහරගම, 1964.

11. සරච්චන්ද්‍ර එදිරිවීර සිංහල නවකථා ඉතිහාසය හා විචාරය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ, 2005.

12. සුරවීර ඒ.වී. නවකථා නිර්මාණය හා අවබෝධය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002.